# රවී සිරිවර්ධනයන්ගේ අසත්‍යකරණයට එරෙහිව

*මෙම ලිපියේ පළමු කොටස ගිය වර කලාපයේ පළවිය. මේ එහි අවසාන කොටසයි.*

**රවී සිරිවර්ධන නුතන කවිය ලෙස ගන්නේ ඉහත සඳහන් වන අනුකරණ කවියයි. මේ සියල්ලෙන්ම පැහැදිලි වුයේ අද කවිය පිරිහී ඇති බවයි. නමුත් රවී සිරිවර්ධනට නුතන සිංහල කවිය කුමක්දැයි ඇති නොවැටහීම නිසා සිංහල කවියේ නව ප්‍රවණතාවය ලෙස හයිකු කවි සාරාංශය, කොම්බු, කෝමා, නැවතිම් සළකුණු ස්ථාන ගත කරයි. එසේ කොට සිංහල කවිය හා ගීතයේ වෙනස දැක්වීමට යාන්ත්‍රික මතවාදයක් නිර්මාණය කරයි.**

බලමු දැන් නුතන කවීන් ගේ කාව්‍ය ගීත සේ ගායනා කොට අවස්ථාවන් කිහිපයක්. 'ලාල් හෑගොඩ' කවියාගේ 'මා මිනිසේක් ඔබ ගඟක් නිසා...' කෘතියේ එන 'ඔබ - මා කවි පෙළ "ඔබ රූ දිය මත සිහින් ලෙලෙන් සැලෙනා, තෙලෙඹු පනෙකි සිත මා " නම් සුන්දර ගීතයක් ලෙස සුනිල් එදිරිසිංහ ගායනා කරයි. එසේම එම පද්‍යයේ එන 'සෝබා' නම් කවිය 'ඇදෙනා ගොබයක් නා දල්ලක් - දැවටී සිඹිනා හිරු කිරණක් ලෙසින්' 'අමරදේවයන් ගායනා කරයි' ඉතාම මෑතක 'නන්දා මාලිනියගේ' 'කිඳුරියකගේ' විලාපයෙ' නම් සංයුක්ත තැටියේ 'ධර්මසිරි රාජපක්ෂ' කවියාගේ 'ශක්තියේ පුෂ්පය' නම් කාව්‍ය සංග්‍රහයේ එන,

කියන්න කවිකර අම්මෙනි අවසර  
මහතුන් නැති රට ඇයි උන් අවසර  
දෙව්යෙක් ඇත්නම් ඇහැරී වර වර  
බිම හෙලනා අර දෙගම තලමල

යන කවිය නන්දා මාලිනි හා ගුණදාස කපුගේ විසින් ගීයක් ලෙස ගායනා කරයි. මේ අනුව පෙරදා මෙන්ම අදත් අප්‍රමාණ කාව්‍යයන් ගීතයන් ලෙස එලිදැක්වෙයි. එය අනාගතයේදී එසේම සිදුවනු ඇත. ඒ අනුව ඉහත සම්පූර්ණ ප්‍රකාශණයද එහි එන නුතන කවි එලෙස ගීත සේ ගයා අරුත් මතුකර ගත නොහැකිය යන්නද රවී සිරිවර්ධන තමා විසින්ම අටවා ගත් ප්‍රඥා ප්‍රසාදයක ලැග ගෙන කරන අසත්‍ය කාරණයක් නොවේද ?

ඉහත පැහැදිලි කිරීමෙන් අනතුරුව අපි රවී සිරිවර්ධන ප්‍රකාශ කරන නුතන කාව්‍යයේ න්‍යායාත්මක එළැඹුමට පිවිසෙමු. රවී සිරිවර්ධන මෙහෙම කියනවා. "මන්ද නව කවියෙහි පද බෙදීමේ සිට කොමාවක්, නැවතීමේ තිතක් දක්වා වූ මුළු මහත් කාව්‍ය ශරීරයම දෘෂ්‍යමය ....ඩකල අනුව අරුත් ගන්වා ඇති බැවිනි." පළමුව අපි මෙය විශ්ලේෂණය කරමු.

රවි සිරිවර්ධන නුතන කවිය ලෙස මේ විග්‍රහ කරන්නේ කවියේ ආකෘතිය නම්, ආකෘතියෙන් කවියක් නුතනයද, නැත්ද? පෙන්නුම් කරන්නේ, කවිය පිළිබඳ රවි සිරිවර්ධන ගේ දැනිමේ සිමාවයි. අපි රවි සිරිවර්ධනම නුතන කවියකු ලෙස උපම ගන්වන 'ආරියවංශ රණවීරයන් ගේ ' මේ ප්‍රකාශය දක්වමු. එතුමා කියනවා "කවියට නිශ්චිත වු නිර්වචනයක් අර්ථ කනයක් දෙන්න බැහැ කවිය කියන්නේ පරිකල්පණය පුබුදුවා නිදහස් පියාපත් විහිදවිය යුතු කලාවත්, නිශ්චිත රාමුවකට, නිශ්චික වපසරියට කවිය සීම කරන්න බැහැ යනුවෙන්. (සිළුමිණ 2009 මැයි 31) අපි තවත් උදහරණයක් ගෙන බලමු. 2008 වසරේ රාජ්‍ය සාහිත්‍යය උළෙලේ හොඳම කාව්‍ය සංග්‍රයට හිමිතැන දිනු 'ලක්ෂාන් අතුකෝරල' (යටිවියන කාව්‍ය සංග්‍රහය) සැඳෑස්ද, නිසැඳෑසද, හයිකු ද කියලා කලින් සැලසුම් කරනන් බැහැ. සමහරු අදහස් කියන්න දීර්ඝ කවියක් ලියන්න පුළුවන. සමහර අදහසකට වචන කිහිපයක් ඇති. කවියට සීමා නැහැ. කවියා විසින්ම තමාගේ කවි වලට සීමා පනවා ගත යුතුත් නැහැ. ( සිවිමිණ 2008, නොවැම්බර් 02) යනුවෙන් ප්‍රකාශ කරමි.

මේ අනුව කොමා, නැතීමේ ලකුණ හරහා හයිකු කවියේ ආභාෂය රවී සිරිවර්ධන ගන්නේ සිංහල නුතන කවිය ලෙස වැරදියට අවබෝධ කර ගැනීමෙනි. එය නුතන සිංහල කවිය ලෙස ගැන්වීමට රවි සිරිවර්ධන විසින් සිදු කරනා අසත්‍ය කාරණයකි. නුතන කවියට සිමා රාමු, රවි සිරිවර්ධන තිත්, කොම්බු අත්‍යවශ්‍ය නැත.

දෙවනුව රවි සිරිවර්ධන කවිය පිලිබඳව කරනා දර්ශනික එළඹුමට පිවිසෙමු. "මන්ද අතීතයේ කවිය හා බැඳී ශ්‍රව්‍ය ගෝචර ලක්ෂණ පවා අද එතුලින් බොහෝ ලෙස දුරස්ථ වෙමින් පවතියි. ඒ වෙනුවට කවිය ප්‍රබල දෘෂ්ටිගෝචර අකෘතියකින් සැරසී වඩා බුද්ධියට දර්ශනික අරුත් ප්‍රකාශ කරන දිසාවකට විතැන් වී තිබේ. ගීතයේ ගායනා කොට තිබේ."

නුතන කවිය වඩා බුද්ධිමය දර්ශනික අරුත් ප්‍රකාශකරන දිසාවකට විතුන් කිරීමට වෑයම් කිරීමෙන් රවී සිරිවධර්න කවිය පිළිබඳ නුතන කථිකාවතේ ඔහු සතු සීමා සහිත කම නැවතත් පෙන්වයි. කවියකින් බලාපොරොත්තු වන රසය වදන් මුල් කොට බිහිවන අරත් රසයයි. කවිය පිළිබඳ දර්ශනික එළැඹුම යන්න කොළඹ කවියම එරෙහිව නිසැදැස් කවීන් විසින් මතුකළ ආදි කල්පිත සංකල්පයකි. රවී සිරිවර්ධන ගෙන් නැගෙන්නේ මේ ආදි සංකල්පයේ දෝංකාරයයි. ගුණදස අමරසේකරයන් කවිය පිළිබඳ මෙසේ පවසයි. "කවියා අපගේ හදවතට ආමන්ත්‍රණය කරන්නේය, යන්නෙහි මුලික අරුත නම් ඔහු අපගේ බුද්ධිමයට විපය වන අදහස්, උදහස් , මතිමතාන්තර, ධර්මෝපදේශ, දර්ශනිකමත ඉදිරිපත්කරන්නෙකු බවයි. කවියා ඉදිරිපත් කරන්නේ අදහස් නොව අනුභූතින්ය." (අසක් දූ කව - පි.61) තවදුරටත් රවී සිරිවර්ධන සඳහන් කරන ආරියවංශ රණවීරයන්ගේ ප්‍රකාශයක් ගෙන බලමු. "දැන් ටී.එස්.එලියම් වගේ කෙනෙක් ගත්තොත් "කවියේ සමාජ කාර්යය" ඥන කථා කරනවා. තවත් අයෙකු කවිය හා චිත්ත රූප ගැන කථාකරනවා. තවත් කෙනෙකු කවිය, ඉතිහාසය හා දර්ශන වාදය වගේ දේවල් සංස්න්දනය කරනවා. "විලියම් වර්ඩ්ස්වර්ත් වගේ කෙනෙක් කවිය යනු කුමක්ද? වගේ දේවල් සාකච්ඡා කරනවා." (සිළුමිණ ,2009 මැයි 31)

මේ අනුව නුතව කවියේ සාකච්ඡාව දර්ශනික තලයට තල්ලු කිරිමෙන් රවී සිරිවර්ධන කරන්නේ ඉතාමත් ප්‍රාථමික මතයක් දැරීමයි. ආරියවංශ රණවීරයන්ගේ උපුටා දැක්වීම තුළ කවියේ මහා පළල් විහිදිම දර්ශනික තලයට සිමාවන්නේ නැහැ. අමරසේකරයන් කවිය ඊටත් එහා විහිදනවා. මේ අනුව නුතන කවිය අරඹයා රවී සිරිවර්ධන කරන්නේ හිස් වදන් වැලක් ඇමිණිම පමණයි.

විෂය මුලික අසත්‍යකරණය :-

නුතන කවිය හා ගීතය පිළිබඳව ලංකාව තුළ මතවාදයන් හා මහා සංවාදයක් දැන් ඇවිලෙමින් තිබෙනවා. රවී සිරිවර්ධනට අන් අයට නින්දා කිරීමට ඇති ඉන්මන්කමක් මේ සංවාදය පිළබඳව ඇති නොදැනුවත් කමත් නිසා මේ මත වාදයේ ඇති මුලික සිද්ධාන්ත ඔහු ඔළුවෙන් සිටවනවා. අසත්‍යකරණයේ යෙදෙනවා.

පළමුවැන්න, ඇත්ත වශයෙන්ම කවිය හා ගීතය පිළිබඳ නුතන සංවාදය මතු වුයේ නුතන කවිය අන්තයටම පිරිහීමේ සංදර්භය තුළය. " කවිකෙත වල්බිහි වී ඇත" යන්න මේ සංවාදයේ ඉපදීමයි. රවී සිරිවර්ධන එය නුතන කවියේ නව ප්‍රවණතා සහ ප්‍රබෝධය ලෙසින් ගනියි. ඒම-ගින් ඔහු මුළු කථිකාවතම ඔළුවෙන් සිටුවයි. ගුණදස අමරසේකරයන් මේ යුගය දකින්නේ, "කවිය ගීතයෙන් අවසන් වු ලෙසද, කවීන් ගීත රචකයින් බවට පත් වු ලෙසද, වර්තමාන යුගය කවියේ ඛේදවාචකය සනිටුවහන් කරන යුගයද

## තිස්ස අබේසේකරයන් වෙනුවෙන් පමණක් ම......

ලෙසය. සුනිල් ආරියරත්නයන් මෑතක මෙල්බන් නුවරදී ප්‍රකාශ කලේ "නුතන කවිය පිරිහි ඇති බවත්, එයට එකම හේතුව ගීතය පමණක් නොවන බවත්ය. ආරියවංශ රණවිරියන් "අද බිහි වන කවි වල අරමුණක් නැහැ, ඒවායින් තාවකාලික ගොඩනැගීමක් පමණයි පෙන්නුම් කරන්නේ. වතීමාන කවීන් වචන ටික උගුලකට දලා උගුල අරිනවා වගේ දෙයක් කරන්නේ. ඇතුල් හදවතේ, තෙපුල් දෙන ගුණාංග වතී මාන කවීන් අතරෙන් ගෙවී ගොස් තිබෙනවා. (සිළුමිණ 2009 මැයි 31) යනුවෙන් ප්‍රකාශ කරයි. එරික් ඉලෙයප්පාරච්චි විචාරකයා මෙසේ කියයි. "නුතන කවිය ඇසුරේ බොහෝ විට දක්නට ලැබෙන්නේ අනුකරණය පමණයි. බටහිර කවිය නිවැරදිව කියවීමට උත්සහ කිරීම හේතුකොට ගෙනයි මේ ගැටළුව පැන නගින්නේ අපි බටහිර කවිය අපේ අස්ථානයේ සිට වැරදියට කිව යුතුයි. නිර්මාණ ප්‍රවාහය ඇති වන්නේ වැරදි කියවීම මගින් පමණයි." (සිළුමිණ 2008 ජුනි 8) මේ අනුව නුතන යුගය කවියේ බිද වැටීමයි. රවී සිරිවර්ධන නුතන කවිය ලෙස ගන්නේ ඉහත සඳහන් වන අනුකරණ කවියයි. මේ සියල්ලෙන්ම පැහැදිලි වුයේ අද කවිය පිරිහී ඇති බවයි. නමුත් රවී සිරිවර්ධනට නුතන සිංහල කවිය කුමක්දැයි ඇති නොවැටහීම නිසා සිංහල කවියේ නව ප්‍රවණතාවය ලෙස හයිකු කවි සාරාංශය, කොම්බු, කෝමා, නැවතිම් සළකුණු ස්ථාන ගත කරයි. එසේ කොට සිංහල කවිය හා ගීතයේ වෙනස දැක්වීමට යාන්ත්‍රික මතවාදයක් නිර්මාණය කරයි.

රවී සිරිවර්ධනට ඇත්ත වශයෙන්ම නුතන සිංහල කවිය සහ ගීතයේ වෙනස පිළිබඳ සංවාදය දැන ගැනීමට අවශ්‍ය නම් කළ යුත්තේ "නව කවියෙහි පද බැදිමේ සිට කොමාවක්, නැවතිමේ තිතක්, දක්වා වු මුළු මහත් කාව්‍ය ශරීරයම දෘශ්‍යමය හැඩතල අනුව අරුත්ගත්වා ඇත." යනුවෙන් අනුකාරක කුඩා ශරීරයක් පමණක් ඇති කවිය හා කවි ආකෘතිය , නුතන සිංහල කවිය සේ ගැනීම නොවන අතර ඒ නිසාම "නුතන කවි එලෙස ගීත සේ ගයා එහි අරුත් මතුකර ගත නොහැකිය. යනුවෙන් සිංහල කවියේ සහ ගීතයේ වෙනස එතරම් ප්‍රාථමික තත්වයකට නොහෙලා, අනෙකාට නින්දා කරන උපන් ගෙයි සිරිතෙන් මදක්වත් මිදී, හික්මීමෙන් හා ඉවසීමෙන් ලංකවේ කවිය සහ ගීතය පිළිබඬව ඇති වී තිබෙන පුළුල් සංවාදයට කන් දී සිටීමය.

දෙවැන්න,

රවී සිරිවර්ධන මේ සංවාදයේ මුලික පදනම කිසිසේත් නොහඳුනයි. ඒ නිසා ඔහු මවා ගන්නා පදනමක සිට අසත්‍යකරණයෙහි යෙදෙයි. නුතන සංවාදයේ පදනම පාඨකයන්ට දැන ගැනීම පිණිස "ගුණදස අමරසේකරයන්" ගේය සාහිත්‍යය ප්‍රවර්ධනය කිරීමේ නියැලුණු විදග්ධයන් විසින් එය හදුන්වනු ලබන්නේ සිංහල කවි කෙත තුළින් පහළ වී ඇති අනර්ඝ නව බෝග යක් ලෙසයි. "සුචරිත ගම්ලත්" වැනි විචාරකයන් විසින් මේ වන හෝගයේ සමාජවාදී ගුණය ගැනද, විශ්ලේෂණයක යෙදෙන බව අපට දැකිය හැකිය. මේ විචාර නිසා මේ ගේය සාහිත්‍ය නැමැති නව හෝගය සිංහල කවියෙහි, කාලානුරූප පරිණාමයක් ලෙසද, දිගුවක් ලෙසද, මේ විදග්ධයන් විසින් හඳුන්වා දෙනු ලැබේ. (අසක් දූ කව, පි. 55) යනුවෙනි.

මේ තුලින් ගම්‍ය වන ප්‍රධාන මත දෙකක් වෙයි.

01. ගීතය කවියේ කාලානුරූප පරිණාමයක්ය. දිගුවක්ය. (ඉහත විචාරකයන් මෙන්ම තිස්ස අබේසේකරයන්ද ඒ මතය ගන්නවා විය හැකිය.)

02.කවිය ගීතයෙන් වෙන්වු ස්වාධීන කලාමධ්‍යයක් වෙයි.
(මෙය ගුණදස අමරසේකර වැන්නන් නියෝජනය කරයි.)

මේ මත තුළින් කුමන මතය නව ප්‍රවණතාවත් නියෝජනය කරන්නේද, කුමන මතය නිවැරදිද යන්න, නිව නොහැක. මන්ද ඉන් කුමන මතය හරිදැයි කියා ලංකාවේ නිතියක් පැවනී නැති බැවිනි. එනමුත් දැන් එය අපුරු සංවාදයකට තෝතැන්නක් නිර්මාණය කර තිබේ.

මේ මත දෙක පිළිබඳව හෝ, ඒ මත ගන්නා අය පිළිබඳව කිසිඳු වැටහීමක් නොමැති රවී සිරිවර්ධන, "තිස්ස අබේසේකරයන් කවියේ සහ ගීතයේ නව ප්‍රවණතා පිළිබඳව අනවබෝධය ප්‍රදර්ශණය කරයි." යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් කරන්නේ, රවී සිරිවර්ධන තුළ ඇති අනවබෝධය ප්‍රදර්ශණය කිරීම හැර අන් යමක් නොවෙයි.

තම මග හිදිමින් තිස්ස අබේසේකරයන් විසින් , "උඩු ගං බලා" සංවාදයේදී, ප්‍රකාශ කල අර්ථයෙන් සියල්ල එතුමා තර්කානුකූල අවසානයක් කරාගෙන ගොස් ඇත.

ලක්ෂ්මන් වැලිවිටිය

